රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07,
1983 ඔක්තෝබර් මස 31 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හයවන සංශෝධනය - ප්‍රතිඥාව/දිවුරුම් දී අත්සන් කිරීම**

1983 අගෝස්තු මස 18 වන දින හා අංක.222 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8 වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත සඳහන් පරිදි කරුණාකර ආදේශ කරන්න.

8. (අ) මෙම චක්‍රලේඛයේ 1 වන ඡේදයේ සඳහන් කිසියම් වර්ගයකට ඇතුළත්, 1983 අගෝස්තු මස 08 වන දිනට පසු පත් කරනු ලැබූ තැනැත්තකු එකී තනතුරට පත් කරනු ලැබ මසක් ඇතුළත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වන උපලේඛනයෙහි දැක්වෙන ප්‍රතිඥාව හෝ දිවුරුම දී අත්සන් කළ යුතුය.

(ආ) ඔහුගේ පත්වීම ලැබ මසක් ඇතුළත ප්‍රතිඥාව හෝ දිවුරුම දී අත්සන් තැබීම කළයුතු බවත්, එසේ නොකරන තැනැත්තකු එකී සේවයෙන් හෝ ධුරයෙන් පහ වන බවත් පත්වීම් ලිපියෙහි අඩංගු විය යුතුය.

(ඇ) එසේ ප්‍රතිඥාව හෝ දිවුරුම් දී අත්සන් තබන ලද තැනැත්තන් සම්බන්ධයෙන් ඉහත 6 වන ඡේදයෙහි සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය. එසේ වුවද, නව පත්වීම් ලැබ මසක් ඇතුළත ප්‍රතිඥාව හෝ දිවුරුම් දී අත්සන් නොකරන තැනැත්තන් සම්බන්ධයෙන් ඉහත 7 වන ඡේදයෙහි සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය.

(ඈ) අංක.222 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1 වන ඡේදයෙහි සඳහන් කිසියම් වර්ගයකට ඇතුළත් වන තැනැත්තකු අත්සන් තැබීම කළයුතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වන උපලේඛනයෙහි දැක්වෙන ප්‍රතිඥාව හෝ දිවුරුම හෝ පමණි.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය

-/නුග.